**ශීර්ෂය 20 - මැතිවරණ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 20 - මැතිවරණ දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 20 දින මැතිවරණ දෙපාර්තමේන්තුවේ මැතිවරණ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

මැතිවරණ දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 5,966.40 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 5,848.91 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 117.49 ක් හෙවත් සියයට 1.97 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 5,913.43 | 5,802.76 | 110.67 | 1.87 |
| මූලධන | 52.97 | 46.15 | 6.82 | 12.87 |
| **එකතුව** | **5,966.40** | **5,848.91** | **117.49** | **1.97** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

මැතිවරණ දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 02001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 27.75 | 14.65 | 16.00 | 17.34 | 80.00 | 56.65 |

**2.3 අග්‍රිම ගිණුම**

මැතිවරණ දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0121/0015/000 අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 30.96 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම්**

මැතිවරණ දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 5.62 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0001/0066/000 | 0.38 |
| 6000/0000/00/0002/0086/000 | 0.10 |
| 6000/0000/00/0016/0038/000 | 5.02 |
| 6000/0000/00/0018/0048/000 | 0.12 |
| **එකතුව** | **5.62** |

## 2.5 විගණන නිරීක්ෂණය

මැතිවරණ දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛනයක් පවත්වා නොතිබුණු අතර එක් ලේඛනයක් අස්ථානගත වී ඇති බව නියැදි විගණන පරීක්ෂාවේදි නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විධිමත් පරිදි පවත්වා නොතිබුණි. |
| (ii) | ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය | මුදල් රෙගුලාසි 451 | අස්ථානගත වි තිබුණි. |

### 3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

විෂය අංක 02001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,146,584 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 05 ක සිට වර්ෂ 15 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගෙන නොතිබුණි.

(ආ) සේවය අතහැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ එකතුව රු.242,131 ක ණය ශේෂ වර්ෂ 15 ක කාලයක සිට පැවැත එමින් තිබුණත්, එම ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

---------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

පිරිවැය රු.11,499,999 ක් වූ මෝටර් වාහන 02 ක් වර්ෂයක පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

-----------------------------------------------------------------

වෙනත් ආයතන සතුව තිබුණු මෝටර් වාහන 03 ක් විධිමත් පරිදි පවරා ගැනීමකින් තොරව දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**3.4 අනුකූල නොවීම්**

-----------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 (ඉ) අනුව්‍යවස්ථාව | - | මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව කොමිෂන් සභාව විසින් පත් කළ යුතු වුවත්, මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයකු පත් කර නොතිබුණි |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 237 (ආ) | 1,291,873 | SQL Server 2014 මෘදුකාංග 03 ක් දෙපාර්තමේන්තුව වෙත සැපයීමට පෙර 2015 දෙසැම්බර් 31 දින ඒ සඳහා ගෙවීම් කර තිබුණි. |

(ii) මුදල් රෙගුලාසි 1647 (ආ) - මැතිවරණ දෙපාර්තමේන්තුව සතු වාහනද ඒවායේ උපකරණද පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

**3.5 අවිධිමත් ගනුදෙනු**

--------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

--------------------------------------------------------------------

SQL Server 2014 මෘදුකාංග 03 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.1,291,873 ක් 2015 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි. ඒ සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ කමිටුවක් ඉදිරියේ ලැබී තිබුණු ලංසු විවෘත කළ බවට තහවුරු වි නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.3 මාර්ගෝපදේශය ප්‍රකාරව පිරිවිතර අනුකූලව භාණ්ඩ ලද බවට වගකිව යුතු නිලධාරියෙකුගේ සහතික වීමකින් තොරව මුදල් ගෙවා තිබුණි.

**(ආ) මැතිවරණ දෙපාර්තමේන්තුවේ 60 වන වර්ෂ පූර්ණය සැමරිම**

----------------------------------------------------------------

මැතිවරණ දෙපාර්තමේන්තුවේ 60 වන වර්ෂ පූර්ණය සැමරීම සහ දකුණු ආසියානු රටවල මැතිවරණ බලධාරීන්ගේ සමුළුවේ 6 වන සැසිවාරය සඳහා රු.10,933,624 ක වියදම් භාණ්ඩාගාරය විසින් අනුමත කර නොතිබුණි. මැතිවරණ පැවැත්වීමේ හා ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ වැය විෂයය යටතේ එම වියදම් සිදු කර තිබුණි.

**3.6 පාඩු හා හානි**

---------------

සමාලෝචිත වර්ෂයේදී වාහන අනතුරු දෙකකට අදාළ එකතුව රු.148,229 ක අලාභ හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1)(අ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.7 අනාර්ථික ගනුදෙනු**

----------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2015 වර්ෂයේදී ජීප් රථයක් අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා රු.128,444 ක වැය කර තිබුණත්, එය සමාලෝචිත වර්ෂයේදී ධාවනයෙන් තොරව පරිශ්‍රය තුළ ගාල් කර තිබුණි.

(ආ) මැතිවරණ දෙපාර්තමේන්තුවේ භාවිත කරන මුද්‍රණ යන්ත්‍ර සඳහා අවශ්‍ය ටෝනර් අවශ්‍යතාවය පිළිබඳ සැලකිලිමත්වීමෙන් තොරව මිලදී ගැනීමට කටයුතු කිරීම නිසා රු.7,471,297 ක් වටිනා ටෝනර් 571 ක් ගබඩාවේ ඉතිරිව තිබුණි. 2016 වර්ෂය ආරම්භයේදී පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම පැවැත්වීමට නියමිතව තිබුණු නිසා එම ටෝනර් තොගය මිලදී ගෙන තිබුණත්, අනපේක්ෂිත හා දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැරව සිදු වී තිබුණු කරුණු නිසා එම කාල

පරිච්ඡේදයේදී මැතිවරණය පැවැත්වීමට නොහැකි වූ බැවින් ටෝනර් තොගය ඉතිරි වූ බව විගණනය වෙත දන්වා තිබුණි.

**3.8 කළමනාකරණ දුර්වලතා**

වාහන භාවිතය සඳහා හිමිකම් නොමැති නිලධාරීන්ට මැතිවරණය පැවැත්වෙන කාලසීමාවන්හිදී කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සලසා තිබුණද, එම පහසුකම මැතිවරණ නොපැවැත්වෙන සාමාන්‍ය රාජකාරීවල නිරතවන කාල සීමාවන්හිදීද ක්‍රියාත්මක කර තිබුණි.

**3.9 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 54 | 41 | 13 |
| (ii) | තෘතියික මට්ටම | 22 | 06 | 16 |
| (iii) | ද්විතියික මට්ටම | 475 | 374 | 101 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 225 | 201 | 24 |
| | **එකතුව** | **776** | **622** | **154** |